මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\47 2023.04.11

මැතිවරණ කොමිෂන් සභාව විසින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම නියමිත පරිදි පැවැත්වීම සඳහා විවිධ අවහිරතා මධ්‍යයේ වුව ද කටයුතු කළ අතර, ඒ සඳහා අවශ්‍ය වන්නා වූ මුල්‍ය ප්‍රතිපාදන නොලැබීම හා කොමිෂන් සභාවේ පාලනයෙන් තොර වූ හේතු මත 2023.04.25 දිනට නියමිතව තිබූ එකී ඡන්ද විමසීම පැවැත්වීම දෙවන වතාවට ද කල් දැමීමට සිදු වී ඇත. එබැවින් අදාළ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීමේ නිශ්චිත දිනයක් තහවුරු වීමෙන් හෝ ගරු ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ තිබෙන නඩු කටයුතු අනුව ගරු අධිකරණය විසින් ලබා දෙනු ලබන තීරණය මත දිනයක් තීරණය කිරීමට සිදු වන්නේ නම් එම දිනය හෝ යන ප්‍රථමයෙන් ලැබෙන අවස්ථාවේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම සඳහා දිනය තීරණය කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් විමසීමෙන් අනතුරුව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සිදු කරනු ලබනු ඇත. කෙසේ වෙතත් මේ දක්වා මැතිවරණ කොමිෂන් සභාව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම කඩිනමින් පැවැත්වීම සඳහා ගත් සියලු ක්‍රියාමාර්ග අඛණ්ඩව ඉදිරියටත් ගනු ලබන බව ද නිවේදනය කර සිටී.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි .

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්